ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකඃ 2477424, 2477423, 2477311
ෆැක්ස්ඃ 2346257, 2477739
ඊ-මේල්ඃ dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියඃ www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව |
| දිනය | **2014.08.25** |

## ශ්‍රී ලංකා මහ බැංකුව, චීන මහ බැංකුව සමග ආයෝජන කටයුතු සම්බන්ධ ද්විපාර්ශ්වික ගිවිසුමකට එළඹෙයි

ශ්‍රී ලංකා මහ බැංකුව සිය විදේශ සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම් තව දුරටත් විවිධාංගීකරණය කිරීමේ පියවරක් ලෙස 2014 අගෝස්තු මස 25 වන දින චීන මහ බැංකුව සමඟ චීන රෙන්මින්බි සුරැකුම්පත්වල ආයෝජනය කිරිම සඳහා ද්විපාර්ශ්වික ගිවිසුමකට එළඹෙන ලදී. මෙමගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලෝකයේ විශාලතම වූත්, ප්‍රවර්ධනාත්මක වූත් සුරැකුම්පත් වෙළඳපොළක් වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලැබෙන අතර ශ්‍රී ලංකාව සහ චීනය අතරත්, දෙරටේ මහ බැංකු අතරත් සහයෝගීතාව තව දුරටත් වර්ධනය වීමක් ද සිදු වේ. මෙම ගිවිසුමට එළඹීම සම්බන්ධයෙන් බීජිං චීන මහ බැංකු පරිශ්‍රයේ පැවති විශේෂ උත්සවයකදී ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා, චීන මහ බැංකු අධිපති සොව් සිආවෝචුවාන් මහතා සමග නිළ වශයෙන් අදාළ ගිවිසුම් පිටපත් හුවමාරු කර ගැනීම සිදු කරන ලදී.

මෙම උත්සවයට චීන මහජන සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති රන්ජිත් උයන්ගොඩ මහතා ද සහභාගී වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එච්. ඒ. කරුණාරත්න මහතා සහ රාජ්‍ය ණය අධිකාරි එන්.ඩබ්.ජී.ආර්.ඩී.නානායක්කාර මහතා ද, චීන මහ බැංකුව පාර්ශ්වයෙන් එහි ජ්‍යෙෂ්ඨ නිළධාරීහු පිරිසක් ද සහභාගී වූහ.

ඡායාරූපයෙන් දැක්වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා සහ චීන මහ බැංකු අධිපති සොව් සිඕචුආන් මහතා චීන මහ බැංකු පරිශ්‍රයේදී නිළ වශයෙන් අදාළ ගිවිසුම සඳහා අත්සන් තැබූ අවස්ථාවයි.

